අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

+9411-2697721/+9411-2691378
+9411-2674768
info@mohe.gov.lk www.mohe.gov.lk

18, වෝඩ් පෙදෙස, කොළඹ 07.
18, வோட் பிளேஸ், கொழும்பு 07.
18, Ward Place, Colombo 07.

මගේ අංකය எனது இல. My No. HE/AD/VP/GEN (IX)

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023.04. 25

සහාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති වක්‍රලේඛ අංක. 01/2018, 01/2018 (I) අනුව සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය.

මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරින්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම මැයෙන් 2022.08.22 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක PED 05/2022 සමඟ බැඳේ. (පිටපත අමුණා ඇත.)

02. ඒ අනුව, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති වක්‍රලේඛ අංක. 01/2018 හි 3.4 වගන්තිය යටතේ ආවරණය නොවන වැටුප් රහිත නිවාඩු, සහනදායී මෝටර් රථ බලපත්‍රයක් ලබා දීම සඳහා අදාල කර ගනු ලබන සක්‍රීය සේවා කාලයක් සේ සැලකීමට හැකියාවක් නොමැත.

03. එහෙයින්, රජයේ විශ්වවිද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටමට "ට අයත් තනතුරක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටමට " ට අයත් විධායක තනතුරක සේවය කරන නිලධාරින් සහනදායී මෝටර් රථ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක PED 05/2022 ප්‍රකාරව විදේශීය නිවාඩු ලබා ගෙන ඇත්නම් හෝ නිවාඩු ලබා ගන්නේ නම් ඒ පිළිබඳ අදාල විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතන විසින් සඳහන් කර එවිය යුතු අතර, ඒ සම්බන්ධ පූර්ණ වගකීම අදාල විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතන මඟින් දැරිය යුතු බවත් , තවද මේ පිළිබඳ ඔබගේ අවධානය යොමු කර ඔබගේ නිර්දේශය සහිතව අයදුම්පත ඉදිරිපත් කරන ලෙස ලෙස කාරුණිකව දන්වමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

අනෝජා පී. ගුරුගේ
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
ලේකම් වෙනුවට

දුරකථන අංකය : +94 112- 688 338
ෆැක්ස් අංකය : +94 112- 688 338
විද්‍යුත් තැපෑල : addsec-admin@mohe.gov.lk

ගරු අමාත්‍යතුමා
கௌரவ அமைச்சர்
Hon. Minister
+94112685268
+94112682612
minister@mohe.gov.lk

ලේකම්
செயலாளர்
Secretary
+94112671355
+94112674770
secretary@mohe.gov.lk